සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2015**
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: සංගීතය (පෙරදිග) | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 1 වි.30 |

නම :- ........................................ විභාග අංකය :- ....................

සැලකිය යුතුයි:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් හිමි වේ.

---

- 01 - 11 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

(01) සප්තකයේ ඇති අචල ස්වර වනුයේ,
(1) ස රි (2) ග ප (3) ම ප (4) ස ප

(02) දකුණතින් ස්වර පුවරුව වාදනය කිරීමේ දී සරිගරි යන ස්වර හතර සඳහා ඇඟිලි හැසිරවිය යුතු පිළිවෙළ වන්නේ,
(1) 1 2 3 4 (2) 1 2 3 2 (3) 1 2 1 3 (4) 1 2 1 2

(03) බටනලාවේ සිදුරු සියල්ල වැසීමෙන් උපදින ස්වරය වන්නේ,
(1) පංචමය (2) මධ්‍යමය (3) ෂඩ්ජය (4) ධෛවතය

(04) ම ප ධ නි යන පෙරදිග සංගීතයේ යෙදෙන ස්වර අපරදිග ක්‍රමයට අනුව හඳුන්වන්නේ,
(1) CDEF (2) DFGA (3) FGAB (4) FAGB

(05) කෝමල ස්වරයක් හඳුනාගැනීමට බටහිර සංගීතයේ දී භාවිතා කරනු ලබන සංකේතය වනුයේ,
(1) # (2) ♮ (3) ♩ (4) ♭

(06) සරිසරිග , රිගරි ගම යන ස්වර අභ්‍යාසයේ ඊළඟට යෙදෙන ස්වර ඛණ්ඩය වනුයේ,
(1) මපමපධ (2) ගමගමප (3) ගමධපම (4) පධපධනි

(07) x x x / x x x / x - x / x x x /
ඉහත සඳහන් රිද්ම රටාවට ගැළපෙන ගී පාදය වන්නේ,
(1) දියගොඩ සැමතැන (2) සවන පිනන ගීත මිහිර
(3) මොනවද මුත්තේ මොකද කරන්නේ (4) දියගොඩ සැමතැන

(08) වත්ත කතත් කතත් තා.... කුඹුර කතත් කතත්තා මෙය,

(1) ස්වර ස්ථාපන ගී පාදයකි (2) පාරු කවි පදයකි.

(3) රබන් පදයකි. (4) උපදේශාත්මක ගී පාදයකි.

(09) බංකු රබාන වයන අවස්ථාවක් වනුයේ,

(1) මංගල උත්සවයක දී (2) පෝය දිනක දී

(3) දානමය කටයුත්තක දී (4) හේවිසි වාදනයක දී

(10) තෙරුවන් කෙරෙහි භක්තියෙන් ගයනු ලබන ගීතයක් වන්නේ,

(1) නැළවිලි ගී (2) උපදේශාත්මක ගී

(3) තුන්සරණේ ගී (4) රබන් ගී

(11) "කටු අකුලේ මල් ඇහැරේ" මෙම ගීතය,

(1) අඹ යාලුවෝ ටෙලි නාට්‍යයේ ගීයකි. (2) සූරියඅරණ චිත්‍රපටයේ ගීයකි.

(3) නත්තල් උත්සවයක ගයන ගීයකි. (4) නව නාට්‍ය ගීයකි.

- A කොටසේ අදහසට ගැළපෙන ප්‍රකාශය B කොටසින් තෝරා යා කරන්න.

| | A | B |
|---|---|---|
| (12) | ඇත හිමේ ගිරි මුදුනේ | බටනලාව |
| (13) | උපදේශාත්මක ගීයකි | ශුද්ධ ස්වර ස්ථාපන ගී |
| (14) | දෑතේ ඇඟිලි 6 ක් උපයෝගී කරගනිමින් වයනු ලබයි. | කරුණාව සමඟ හොඳ හිත |
| (15) | සංගීතයේ මෙන්ම නර්තනයේ දී ද වැදගත් වන දෙයකි. | ලය |

- පහත වරහන් තුළ දී ඇති වචන යොදා හිස්තැන් පුරවන්න.

(අනාඝාතාත්මක , සමග්‍රහ, තානායම්පොළ , විෂමග්‍රහ, වයලින්)

(16) කෝලම් නාට්‍ය රඟ දක්වනු ලබන රංග භූමිය .......................................... නමින් හඳුන්වනු ලබයි.

(17) විශාරද සෝමසිරි ඉලේසිංහ, බී වික්ටර් පෙරේරා යන මහතුන් ලංකාවේ දක්ෂතම .......................................... වාදකයින් දෙපළකි.

(18) තාල තැබීමට නොහැකි ගීත .......................................... ගී නමින් හඳුන්වයි.

(19) ගීතයක් ගායනයේ දී ගායනය පළමුවත් තාලය දෙවනුවත් ආරම්භ වීම .......................................... ලෙස හඳුන්වයි.

(20) ගීත ගායනයේ දී තාලයත්, ගීතයත් එකවර ආරම්භ වීම .......................................... ලෙස හැඳින්වේ.

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) (i) ඔබ උගත් ස්වර ස්ථාපන ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 06)

(ii) ඔබ ප්‍රස්තාර කරන ලද ගීතයේ ආරෝහණ හා අවරෝහණ වශයෙන් ස්වර යෙදී ඇති අවස්ථා දෙකක් වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

(02) (i) උපදේශාත්මක ගීතයක මුල් කොටස ලියා දක්වන්න. (ලකුණු 04)

(ii) ඔබ උගත් උපදේශාත්මක ගීත තුළින් ගත හැකි උපදේශ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

(03) පහත දැක්වෙනුයේ කෝලම් රංග සම්ප්‍රදායේ එන ප්‍රධාන චරිත දෙකක් පිළිබඳවයි. එම කරුණු ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- කකුලක් නොන්ඩියි
- තරුණයින්ට ඉඟි බිඟි කරයි.
- මහලු චරිතයකි.
- කපටි චරිතයකි.
- අතේ හැරමිටියක් හා ඔලගුවක් හැමවිටම කරේ දමා සිටී
- තරුණ සිත් ඇද බැඳ ගැනීමේ හැකියාව ඇත.

(i) මෙම චරිත දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) මෙම චරිත දෙකට අදාළ කරුණු වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න. (ලකුණු 06)

(iii) මෙම රංග සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශයක් හා වයන භාණ්ඩයක් නම් කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

(04)




(i) ඉහත කවය තුළ ඇති වචන යොදා ගීතය සම්පූර්ණ කරන්න. (ලකුණු 06)

(ii) මෙම ගීත වර්ගය කුමක් ද? (ලකුණු 02)

(iii) එම ගීත ගායනා කරන අවස්ථා දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 10)